සැ. යු.- 2012.07.27 දින පළ වූ අංක 1769 දරන ගැසට් පත්‍රයේ III හා IV(අ) කොටස් පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,770 - 2012 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2012.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1129 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

### ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(2) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක III වැනි ශ්‍රේණියේ තනතුරට පත් කිරීමට තෝරාගනු ඇත.

3. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම නොපිරවීමට අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

4. මාසික වැටුප් පරිමාණය රු. 13,120- 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - 22,040

5. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6. සුදුසුකම් : ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.1 අධ්‍යාපන සුදුසුකම්

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

6.2 වෘත්තීය සුදුසුකම් : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

6.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6.4 වෙනත් : (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

6.5 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

7. විභාග පරිපාටිය :

7.1 ලිඛිත විභාගය ප්‍රශ්නපත්‍ර 03කින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 දිවයින පුරා උපලේඛන 1 හි සඳහන් නගරයන්හි දී විභාගය පැවැත්වේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් යාබද නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

(රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

7.3 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

08. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගයේදී ප්‍රශ්න පත්‍ර 03 සඳහාම එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ඉක්මවා ලබාගන්නා සියළුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමුකොට ලිඛිත විභාගයේදී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල එකතුව මත සකසන ලද කුසලතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවාගනු ලැබේ. පත්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු අවසන් වීමෙන් අනතුරුව සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකරනු ලැබේ.

(ආ) ලිඛිත විභාගය : ප්‍රශ්න පත්‍ර (03) කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | විෂය අංකය | කාලය | මුළු ලකුණු | සුදුසුකම් ලැබීමේ අවම ලකුණු |
|---|---|---|---|---|
| භාෂා හැකියාව | 01 | පැය 01 | 100 | 41 |
| අභියෝග්‍යතාවය | 02 | පැය 01 | 100 | 41 |
| විෂයානුබද්ධ අධ්‍යයනය පිළිබඳ දැනුම | 03 | පැය 01 | 100 | 41 |

(ඇ) විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| භාෂා හැකියාව | මෙම ප්‍රශ්නපත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. |

| | |
|---|---|
| අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. |
| විෂයානුබද්ධ අධ්‍යයනය පිළිබඳ දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරය තුළ කාලීන වැදගත් සිදුවීම්, ඉතිහාසය, සංස්කෘතිය, වාර්ගික අර්බුද හා සමාජ ඒකාබද්ධතාවය ආරක්ෂා කිරීම වැනි ක්ෂේත්‍රයන්ට අදාළව දැනුම පරීක්ෂා කෙරෙන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. |

(ඉ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| | පරීක්ෂා කර බලා ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. | ඉංග්‍රීසි භාෂා දැනුම | 20 |
| 3. | දෙමළ/සිංහල භාෂා දැනුම | 20 |
| 4. | පරිගණක දැනුම | 10 |
| 5. | වෘත්තීය සුදුසුකම් | 25 |
| 6. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 |

09. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් : ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

10. විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 500 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපතෙහි දාරයකින් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් තමන් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අයදුම්කරුගේ නමින්ම නිකුත් කර තිබීම අනිවාර්ය වේ.

11. අයදුම්පත්‍ර : A4 (සෙ. මී. 24 x 29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 2.4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 03 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සඳහන් කළ යුතුය. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

11.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක - III ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය - 2012" යන්න සඳහන් කරන්න.

11.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2012.09.03 වැනි දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. :

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

12. විභාගයට පෙනී සිටීම :

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමෙහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කල ඡායා පිටපතක් ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද, ළඟ තබාගෙනම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12.1 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය :-

* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
* වලංගු විදේශ ගමන් බලපත්‍රය

12.2 විභාගය පැවැත්වෙන දිනයේ විභාග ශාලාධිපති වෙත, තම අත්සන සහතික කරගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

13. අපේක්ෂකයන්හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එම්. එස්. වික්‍රමසිංහ,
ලේකම්,
ජාතික භාෂා හා සමාජ
ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2012 . . . .
ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 40, බුත්ගමුව පාර,
රාජගිරිය.

## *උපලේඛනය* - I

### *නගර නාම ලේඛනය හා අංක*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිවු | 12 |
| වව්නියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිළිනොච්චිය | 25 |

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක III වැනි ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2012 සඳහා ආදර්ශ අයදුම්පත්‍රය**

## Specimen Application Form for the Open Competitive Examination for recruitment to the Post of National Integration Coordinator Grade III - 2012 in the Ministry of National Languages and Social Integration

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද ඇතුළත් කළ යුතුය.

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

* *ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න.*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| | |

(*ගැසට් නිවේදනයේ* 7.2 *ඡේදය බලන්න.*)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 [ ]
පුරුෂ - 2
(අදාළ අංකය කොටුව තුල ලියන්න.)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය (තිබේ නම්) :————.

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 පදිංචිව සිටින කාලසීමාව :————.

3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4.0 උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.
2012.09.03 දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

5.0 අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :—

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ. පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :—

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.0 වෘත්තීය සුදුසුකම් :
(i) ————————.
(ii) ————————.
(iii) ————————.

7.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) :

ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :————.

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල රු. :————.

*විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.*
*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)*

9.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තව ද, මෙහි සියලුම කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිම.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10.0 *(අ) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මහතා/ මහත්මිය/ මෙනෙවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, මෙම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී .............. ......... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

08-88

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත**

*ආධුනිකයින් බඳවා ගැනීම - 2013 වසර*

ජපන් - ශ්‍රී ලංකා සහයෝගීතාවය මත ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2013 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :

| *පාඨමාලා* | *කාලය* | *බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 1.1 මෝටර් රථ කාර්මික ශිල්පී<br>Automobile Mechanic | අවු. 03 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ (මාධ්‍ය භාෂාව), ගණිතය හා විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම - (සැ. යු. ගණිතය I, II සහ විද්‍යාව I, II සමත් අයදුම්කරුවන් එය පැහිදිළිව වෙන් වෙන් වශයෙන් අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.) |
| 1.2 මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>Automobile Electrician | අවු. 03 | |
| 1.3 යන්ත්‍ර ශිල්පී<br>Machinist | අවු. 03 | |
| 1.4 මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී<br>Automobile A/C Mechanic | අවු. 02 | |
| 1.5 මෝටර් රථ වැද්දුම් ශිල්පී<br>Automobile Tinker | අවු. 1 1/2 | |
| 1.6 මෝටර් රථ පින්තාරු ශිල්පී<br>Automobile Painter | අවු. 1 1/2 | |

2. වයස ;
2013.01.01 දිනට වයස අවුරුදු 16 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතු ය.

3. *පාඨමාලා පුහුණු විස්තර ;*

3.1 ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණු ක්‍රමය සහ ද්විත්ව පුහුණු ක්‍රමය අනුව සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.4 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවැනි හා තුන්වැනි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.5 සහ 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුළ දී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර, ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 1.3 පාඨමාලාවේ ලියවන පට්ටල් හා මිලින් යන්ත්‍ර ඇතුලු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර්, ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. *පාඨමාලා කාලය තුළ ලබාදෙන ප්‍රතිලාභ ;*

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක් ලබාදේ.

4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යාධාර ලබාදේ.

4.3 පාඨමාලා කාලය තුළ ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබා දේ.

4.4 පුස්තකාල පහසුකම්/අධ්‍යාපන චාරිකා.

5. *ආධුනිකත්ව ගිවිසුම :*

5.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙක් විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමග ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතු ය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. *සහතිකපත් ප්‍රදානය :*

6.1 සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් "ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටමේ සහතිකය" සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකය ද ප්‍රදානය කරනු ලබයි.

7. *සහතිකපත්ලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ :*

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් 5 (ඩිප්ලෝමා සහතිකය) සහ 6 වන (උසස් ඩිප්ලෝමා සහතිකය) මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහා නැවතත් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයට ඇතුළත්වීමේ වරම්.
7.2 ඉන් අනතුරුව ජාතික වෘත්තීය සුදුසුකම් 7 වැනි (උපාධිය) මට්ටම හැදෑරීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමේ වරම්
7.3 දේශීය මෙන්ම විදේශීය රැකියා සඳහා ඇති ඉහළ ඉල්ලුම.

8. *පාඨමාලා සඳහා තෝරා ගැනීම :*

8.1 බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01 ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර, ඉන් ලබා ගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

9. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

9.1 මී. මී. 290 x මී. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරයක් සමග 2012 සැප්තැම්බර් මස 10 දිනට හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය," යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම - 2013" යනුවෙන් සඳහන් කළ යුතු ය. අප ආයතනයට පැමිණ ද ඉල්ලුම්පත් ලබාගත හැකිය. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත් එවිය හැක.

*අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :-*

9.2 අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම් කළ හැකිය.
9.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
9.4 තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතුව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.
9.5 වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය.

AETI/AD/AP/02

*යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය*
*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය*
*මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය*

**ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2013 වර්ෂය**

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

01. මුලකුරු සමග නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ලිපිනය :

දුරකථන අංකය :

07. පරිපාලන දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උසස්ම සුදුසුකම් X ලකුණින්)

| 8 වන ශ්‍රේණිය | අ.පො.ස. (සා. පෙළ) | අ.පො. ස. (උ. පෙ.) |
|---|---|---|

09. අ.පො.ස. (සා. පෙ.) විභාග ප්‍රතිඵල :

| සමත්වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| 1. ........................ | ............ | ............ |
| 3. ........................ | ............ | ............ |
| 5. ........................ | ............ | ............ |
| 7. ........................ | ............ | ............ |
| 9. ........................ | ............ | ............ |
| 11. ........................ | ............ | ............ |

| සමත් වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| 2. ........................ | ............ | ............ |
| 4. ........................ | ............ | ............ |
| 6. ........................ | ............ | ............ |
| 8. ........................ | ............ | ............ |
| 10. ........................ | ............ | ............ |
| 12 ........................ | ............ | ............ |

අ.පො.ස. (උ. පෙ.) විභාග ප්‍රතිඵල :

| සමත්වූ විෂයයන් | සාමාර්ථය | සමත් වූ විෂයයන් | වර්ෂය |
|---|---|---|---|
| 1. ........................ | ............ | 3. ........................ | ............ |
| 2. ........................ | ............ | 4. ........................ | ............ |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින්

| |
|---|
| 1 |
| 2 |
| 3. |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

08-160

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - මාතලේ ශාඛාව
(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදී)

ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා පාඨමාලා
**COURSES IN GRAPHICS & MULTIMEDIA**

**ශ්‍රී ලංකාවේ මුද්‍රණ, හා ග්‍රැෆික්ස් මල්ටිමීඩියා ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.**

**වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ ග්‍රැෆික්ස් හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයන්ට අදාළ පහත සඳහන් පාඨමාලා අගෝස්තු මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.**

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව / COMPUTER TYPESETTING & LAYOUT DESIGNING**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර, මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්ස් ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම සහ පිටු සැකසීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර මුල සිටම පරිගණක දැනුම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය පිළිබඳව මනා දැනුමක් ලබා දේ.

*පාඨමාලා කාලය : මාස 6යි  මාධ්‍යය : සිංහල  ගාස්තු: රු. 9,500*

**පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව / CERTIFICATE COURSE IN COMPUTER GRAPHIC DESIGN**

අද රැකියා අංශයේ ඉතා ඉහල ඉල්ලුමක්ව පවතින මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයන්ට යොමු වීමට අවශ්‍ය දැනුම ලැබෙන අයුරින් මෙම පාඨමාලාවේ අන්තර්ගතය සකසා ඇති අතර, ඉතා පුළුල් පුහුණු කාලයක් තුළ සෑම ශිෂ්‍යයෙකුටම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් විෂය නිර්දේශය සකසා ඇත.

පරිගණක ආශ්‍රිත නිර්මාණකරණයට උනන්දුවක් දක්වන නවකයන්ටත් ග්‍රැෆික්ස්, ප්‍රචාරක මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රවල නියැලි පුද්ගලයන්ටත් මෙම පාඨමාලාව ඉතා ඵලදායි වනු ඇත.

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ග්‍රැෆික්ස් මෘදුකාංග පිළිබඳ මෙන්ම ග්‍රැෆික් නිර්මාණය පිළිබඳවද ඉතා පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලැබේ.

ඉහත පාඨමාලා සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර දැන් බඳවා ගැනීම ආරම්භ කොට ඇත.

*පාඨමාලා කාලය - මාස 5යි  මාධ්‍යය - සිංහල  පාඨමාලා ගාස්තු - රු. 12,500*

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව / CERTIFICATE COURSE IN MICROSOFT OFFICE**

මෙම පාඨමාලාව තුලින්, MS Office මෘදුකාංග පිළිබඳ පූර්ණ අවබොධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳ මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැර ගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා ගැනීමට කැමති සියලු දෙනාට පොදුවේ ප්‍රයෝජනවත් පාඨමාලාවක් වන අතර කුඩා කණ්ඩායම් ලෙස පුහුණු කෙරේ.

*පාඨමාලා කාලය - මාස 4යි  මාධ්‍යය - සිංහල  පාඨමාලා ගාස්තු - රු. 7,500*

**වෙබ් අඩවි නිරමාණය පිළිබඳ පාඨමාලව / CERTIFICATE COURSE IN WEB DESIGN**

මෙම පාඨමාලාව තුලින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර නවීන තාක්‍ෂණයට අනුකූලව පාඨමාලා අන්තර්ගතය සකස් කර ඇත. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම පරිගණක ආශ්‍රිත පාඨමාලා හදාරණ සිසුන්ටද මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ටද මෙම පාඨමාලාව ඉමහත් රුකුලකි.

*පාඨමාලා කාලය - මාස 4යි  මාධ්‍යය - සිංහල  පාඨමාලා ගාස්තු - රු. 12,500*

**විමසීම් - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
**මාතලේ ශාඛාව,**
**දිසා ලේකම් කාර්යාලය - මාතලේ**
**දුරකථන අංක : 0662222172, 0710554298**
**ඊමේල් :** sliopsaman@yahoo.com

**ප්‍රධාන කාර්යාලය :**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන අංක : 011 2686162, 011 2679791
වෙබ් අඩවිය : www.sliop.edu.com

08-196

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යාංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)

2012 ජූනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.